# ප්‍රධාන රංග ශෛලි

''නාට්‍යශාස්ත්‍රයේ'' 13 වන අධ්‍යායයේ 70-86 යන ශ්ලෝකවලින් දක්වෙන පරිදි නාට්‍ය සම්ප්‍රදාය දෙකකි.

- ලෝකධර්මී
- නාට්‍යධර්මී

වශයෙනි.

## ලෝකධර්මී








පාත්‍රයන් ස්වාභාවික ලෙස හැසිරෙන්නා වූ, අව්‍යාජවූ, විකෘත නොවූ, ලෝකයා ගේ පැවැත් මෙන් ම හා ක්‍රියාවන් යුක්ත වූ. ලාලිත්‍යයෙන් යුතු අංග චලනයෙන් තොර වූ, ස්වාභාවික අභිනයෙන් යුක්ත වූ, නොයෙක් ස්ත්‍රීන් හා පුරුෂයන් පාත්‍රයන් සේ හැසිරෙන්නා වූ යම් නාට්‍යයක් වේ ද එය **ලෝකධර්මී නාට්‍යයක්** ලෙස හැඳින්වේ.

සංස්කෘත නාට්‍යයක ප්‍රකාශ භාෂණය හෙවත් සාමාන්‍ය කථාව හා රහස් දෙඩීම වැනි මූලික දෙබස් ඉදිරිපත්කරන ලද්දේ තාත්විකව ය. එනම් ලොක් ධර්මී සම්පද ායයට අනුවය. කිසියම් රඟපෑමක් මඟින් ලෝකයේ සිදුවන යමක් ඒ අයුරින් ම සිදු කිරීම ලෝකධර්මී සම්ප්‍රදායයට අනුරූපී ය.

ලෝකධර්මී සම්ප්‍රදායයට අනුව වස්තු විෂයය කර ගනුයේ කාලීන පුවතකි. යොදා ගන්නා භාෂාව ව්‍යවහාරෝචිත ය. යාම්, ඊම් ආදී චලන විධි ද, හැසිරීම් ස්වභාවය ද ස්වාභාවික ආකාරයට සිදුවේ. තත්ත්වානුරූපී මායාව ඇති කරලීම සඳහා පසුතල හා නාට්‍යෝපකරණ බහුල ලෙස යොදා ගැනේ. වේෂභූෂණ ද එදිනෙදා අප දකින ඇඳුම් පැලැඳුම්වලට සමීප ය. අංග රචනය හා රංගලෝකය මඟින් ද ස්වාභාවිකත්වය ඉස්මතු කරනු ලැබේ. ලෝකධර්මී සම්ප්‍රදායයේ දී වෙස්මුහුණු භාවිත නො

කෙරෙයි. මෙම ශෛලියට අයත් නාට්‍යයක පසුතල වෙනස් කරන්නේ රංග භූමියේ අඳුර භාවිත කරමිනි.

- *රුසියානු ජාතික ඇන්ටන් චෙකෝෆ් ගේ The proposal (මඟුල් ප්‍රස්තාව)*
- *Cherry Orcherd (චෙරි වත්ත)*
- *නොර්වීජියානු ජාතික හෙන්රික් ඉබ්සන් ගේ Doll's house (සෙල්ලම් ගෙය)*
- *ආර්. ආර්. සමරකෝන් ගේ 'කැලණි පාලම'*
- *ජයලත් මනෝරත්න ගේ ''තලමල පිපිලා''*
- *සුගතපාල ද සිල්වා මහතාගේ තට්ටු ගෙවල්,බෝඩිම් කාරයෝ*

නාට්‍ය නිදසුන් වේ.

## නාට්‍යධර්මී











ස්වාභාවිකත්වයෙන් ඇත් වූ සංවාදවලින් හා රඟපෑම්වලින් යුක්ත වූ ද, ස්වභාවිකත්වයෙන් ඇත් වූ චිත්ත වෘත්ති හා භාව නිරූපණය කරන්නා වූ ද, ලාලිත්‍යයෙන් යුතු අංගහාරයෙන් හා අභිනයෙන් යුක්ත වූ ද, නාට්‍යමය ලක්ෂණයන් ගෙන් උපලක්ෂිත වූ ද, ස්වර හා අලංකාර සහිත වූ ද, අස්වාභාවික ලෙස හැසිරෙන පාත්‍රයන් ඇසුරු කරන්නා වූ ද යම් නාට්‍යයක් වේ ද, එය **නාට්‍යධර්මී** ලෙස හැඳින්විය හැකි ය.

## නාට්‍යධර්මී ලක්ෂණ

ලොව සිදු වන යම් දෙයක් පාත්‍රයන් විසින් මූර්තිමත් ලෙස හා චිත්තාකර්ෂණීය ලෙස නාට්‍යයේ ඉදිරිපත් කරනු ලැබීම නාට්‍යධර්මී ලක්ෂණයකි.

පර්වත, යාන, විමන්, පලිස්, සන්නාහ, ආයුධ, ධ්වජ මූර්තිමත් ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ නාට්‍යධර්මී නාට්‍යවල ය.

එක් භූමිකාවක් රඟපෑමෙන් පසු නළුවා ගේ කෞශල්‍යය නිසා හෝ අන් නළුවකු නොමැතිවීම නිසා හෝ වෙනත් භූමිකාවක් රඟපායි නම් එය ද නාට්‍යධර්මී ලක්ෂණයකි.
ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසයෙන්, වඩා එසැවුණු පියවර තබමින් නැටීම හා ගමන් කිරීමත් නාට්‍යධර්මී ලක්ෂණයකි.

සැප හා දුක දනවන ක්‍රියා ආත්මකොට ඇත්තා වූ ලෝක ස්වභාවය ආංගික අභිනයෙන් ඉදිරිපත් කරනු ලැබීම නාට්‍යධර්මී ලක්ෂණයකි.

මහබඹු විසින් නිර්මිත ඉතිහාසය හා වේදය ගැබ් කොට දෙවියන් ගේ හා මනුෂ්‍යයන් ගේ රස වින්දනය උදෙසා කළ කිසියම් නාට්‍යවේදයක් වේ ද එය නාට්‍යධර්මී වේ.

විවිධ නියම අනුව රංග පීඨය මත ඉදිරිපත් කරනු ලබන කක්ෂ්‍යා විභාගය ද නාට්‍යධර්මී ලක්ෂණයකි.

සියලු අභිනය අලංකාර අංග විලාසයෙන් යුතු ව ඉදිරිපත් කිරීම ද නාට්‍යධර්මී වේ.

ශ්‍රී ලංකාවේ ශෛලිගත වශයෙන් හැඳින්වෙන නාට්‍යය ද නාට්‍යධර්මී වේ. මෙහි දී ද දෙබස් ගීතවත් ව ගැයෙන අතර, නළුවෝ තාලානුකූල ව චලනවල යෙදෙත්.

වේදිකාව සැරසිලිවලින් තොර ය. විශේෂයෙන් සකස් කරගන්නා නාට්‍යෝපකරණ, විශේෂිත අංග රචනා හා වේෂ භූෂණ ද ඇත. වටයක් යාමෙන් ස්ථාන මාරු වීමක් සිදුවීමද, ආතම් භාෂණ ද නාට්‍යධර්මී ලක්ෂණයෝ ය.

නාට්‍ය නිෂ්පාදනයේ දී නාට්‍යධර්මී මෙන් ම ලෝකධර්මී ලක්ෂණ ද සහිත මිශ්‍ර වූ ශෛලියක් ද බොහෝ විට භාවිත කෙරේ.

***ලාංකේය නාට්‍යධර්මී නාට්‍ය සඳහා නිදසුන්***

- *මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගේ මනමේ, සිංහබාහු,ලෝම හංසු*
- *දයානන්ද ගුණවර්ධනයන් ගේ නරිබෑණා*
- *බන්ධුල ජයවර්ධනයන් ගේ බෙරහඬ*

## *ඇගයීම 03*

- ➔ ***ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය පිළිබඳ ව භරතමුනිගේ විග්‍රහය විභාග කරන්න.***
- ➔ ***ලොක් ධර්මී හා නාට්‍යධර්මී නාට්‍යහි දැක්වෙන ලක්ෂණ නිදසුන් සපයමින් විස්තර කරන්න.***

DMAT Imchithry

DMAT imchithry